# ඇඩ්ස්

8

ජගත් ජේ එදිරිසිංහ ලියයි



දැඩි හිරු රැස් ඇළේ දිය රැළි මත පතිතව පරාවර්තනය වෙයි. ඇළ ඉවුර කඩා වැටුණු තැනක සෑදී ඇති දිය වළට බැස සිටින ජයසේන සුරතල් මසුන් ඇති කරන්නන්ට විකිණීම සඳහා පණු කැදලි එකතු කරමින් සිටිනු වැට අසළට වී සිටින සුනන්දට පෙනෙයි.

ගිණිකාස්ටක අව්වෙන් කැකෑරුණ සුළඟ ඩීසල් දුම ද දූවිල්ල ද රැගෙන පියාඹන්නේ වියරු වැටුණාක් සේ ය. පහන් කණුවක එල්ලී සිටින රතු කොඩි වැලක කොටසක් ඒ සුළඟ හා පොර බදිමින් සිටියි. විදුලි කම්බි මත ලැග සිටින කපුටෝ තොර තෝංචියක් නැතිව කෑ ගසති. කොට්ටම්බා ගස් සෙවණේ නිදා සිටින බල්ලාට ඒ ඝෝෂාව නෑසෙන්නා සේ ය.

හුළං ගිය ටයරයක් සහිත සයිකලය තල්ලුකරගෙන ආ අමරේ සුනන්ද දැක මොහොතකට නතර වෙයි.

"පැච්චෙකක් ගියා සුනයියා.." සුනන්ද යමක් අසන්නට පෙරම ඔහු කියයි. සහමුලින්ම වාගේ කට්ට ගෙවී ඇති ටයරය මෙතරම් කාලයක් හෝ ඔරොත්තු දී සිටීම පුදුමයක් යයි සුනන්දට සිතෙයි.

"ටයර්රෙකක් දාගනිං.. ඕක හොඳටම ගෙවිලනෙ.."

අමරේ යමක් කියන්නට ගොස් නොකියා නවතින සැටි සුනන්දට පෙනෙයි.

"ටයර්රෙකක් දාගන්න සල්ලි තියේ නං ඒ සල්ලි වලිං පොඩි එකාට ඉස්කෝලෙ පොත් ටික අරං දෙනවනෙ.." අමරේ කියන්නට ගියේ එවැන්නක් විය යුතු යයි සුනන්දට සිතෙයි. තමා පිළිබඳම උපන් ලැජ්ජාවකින් ඔහු ගේ සිත පිරී යයි. ඡන්ද දායකයන් හමුවේ රණසිංහ සමහර විට කියන්නේ ද මෙවැනි අමනෝඥ කතා නොවේදැයි ඔහුට සිතෙයි. රණසිංහ ගේ මුවින් එවැනි දේ පිට වන විට, මේ මිනිසා සමාජයෙන් කොයි තරම් දුරස් වී සිටින්නේ දැයි තමා සිතූ ආකාරය සුසනන්දට මතක ය.

"ටයර්රෙකක් දාගනිං.. මං සල්ලි දෙන්නං.." අමරේ යමක් කියන්නට පෙරම ඔහු වැට අසළින් මෑත්ව නිවස දෙසට යයි. එවැන්නක් කියන්නට සිතට ඒම සතුටකි. උදෑසන සිට සිතේ තිබූ බරක් බිම තිබ්බාක් වැනි හැඟීමක් ඔහුට දැනෙයි.

හිතට බරක් වැටුණේ උදෑසන ම අයේෂා හෙළි කළ තොරතුර නිසා ය. අජිත් හමුදාවෙන් ඉවත් වූ බවක් හෝ රණසිංහ ඔහුට අධිකාරියේ රැකියාවක් ලබා දුන් බව හෝ අයේෂා කියන තුරු ඔහු නොදැන සිටියේ ය. තමාට නොදන්වා රණසිංහ එවැනි පියවරක් ගත්තේ ය යන හැඟීම පවා ඔහු සිතට වේදනාවක් ගෙන දුන්නේ ය. අවම වශයෙන් ඒ බව තමාට දැන්වීමට අයෝමා හෝ උනන්දු නොවීම ඔහු පුදුමයට පත් කළේ ය.

"ඇයි...? ලොක්ක ඔයාට කිව්වෙ නැද්ද..?" අයේෂා අසන්නේ විමතියෙනි.

ඔහු හිස වනා නැතැයි කියයි.

"ඔයාට තියා මටවත් කිව්වෙ නෑ.. හැම දේම වෙනස් වෙලා.." අයේෂා කියන්නේ කණගාටුවෙන් ය. ඇගේ මුහුණ සුදුමැළි වී ඇතැයි සුනන්දට සිතෙයි. වෙනදා තිබූ ප්‍රභාමත් බව උද්යෝගි මත් බව ඇගේ මුහුණින් පළා ගොස් තිබෙයි.
"අජිත්ට අධිකාරියෙන් පඩි ගෙව්වට වැඩ කරන්නෙ රණසිංහ මහත්තයටලු.."

"මොන වැඩ ද..?" යි අසන්නට සිතුණ ද සුනන්ද මුණිවත රකියි. අනෙක් අතින් අසන්නට දෙයක්ද නැත. අජිත් ලවා කරවා ගන්නට රණසිංහට ඇති වැඩ පිළිබඳ මනා වැටහීමක් තමාට ඇති බව සුනන්ද දනියි.

"ආරක්ෂාව ගැන දැන් වැඩියෙන් හිතන්න ඕනෙලුනෙ.. " සුනන්ද නෑසූ පැනයට අයේෂා පිළිතුරු දෙයි.

සුනන්ද ආපසු එන්නේ කළකිරුණ සිතින් ය. රණසිංහ අජිත් සේවයට ගැනීම ගැන සිතන්නට බොහෝ දේ සුනන්දට ඇත . තමා ලවා ඉටු කර ගන්නට මාන බලා අසාර්ථක වූ බොහෝ කරුණු කාරණා රණසිංහට ඔහු ලවා කර ගත හැකි වනු ඇති බව නිසැක ය. අජිත් පිළිබඳ සුනන්දගේ සිතේ ඇති වන්නේ කණගාටුවකි. මේ තීරණයට එන්නට පෙර අජිත් තමාගෙන් ඇසුවානම් තමා කිසිවිටෙක ඔහුට ඉඩ නොදෙන බව සුනන්දට විශ්වාස ය. රණසිංහ පිළිබඳ තමා තරම් දන්නා කිසිවකු මේ මිහිපිට නැති බව සුනන්ද දනියි.

මහා කළකිරීමක් සිත වසාගෙන පැතිරෙයි. හැකි ඉක්මණින් මේ පරිසරයෙන් ඈත් විය යුතු බව ඔහුගේ සිත කියයි.

සාලයේ සැප පුටුවේ වාඩි වන සුනන්ද කල්පනාවට වැටෙයි.

"සුනන්දයිය දැන් ඇති ඔයා කාලෙ කෑවා.. මං හොටෙල් එක ඇරියම ඔයා එන්න ඕනෙ මා එක්ක ඒ වැඩේට.. රණසිංහකාරයා වගේ මං ඔයාගෙ අනාගතේ උගසට ගන්නෙ නෑ.." නුවර මහ ගෙදරදී කෝසල කියූ සැටි සුනන්දට සිහිපත් වෙයි.

කෝසලගේ යෝජනාව අනුමත කරන බැල්මක් ඒ

**පන්සලේ මහ ගේට්ටුවෙන් ඇතුල් වන සුනන්දගේ මෝටර් සයිකලය පොඩි හාමුදුරුවන්ගේ සිතේ ඇති කරන්නේ සහනයකි. සිත සන්සුන් කර ගෙන සිටින්නට මහත් වීර්යයක් ගනිමින් සිටිය ද තමා ගේ උත්සාහය වරින් වර අසාර්ථක වනු උන් වහන්සේට දැනෙයි. මේ සිදුවූයේ කිසි දිනෙක බලාපොරොත්තු වූ දෙයක් නෙවේ.**
**සුනන්ද දුටු සැණින් සෙදෝරිස් ඝන්ඨාවේ කඹය අතහැර දුව එයි. මහත් කම්පනයකට පත්ව සිටින සියදෝරිස් දකින සුනන්ද ගේ සිතේ ඇති වන්නේ කණගාටුවකි.**
**"ප... පන්සලට බෝම්ම ගැ.. ගැ.. ගැහුවා මහත්තයෝ.." ඔහු කෑ ගසයි.**

මොහොතේ වින්ධ්‍යා ගේ දෑසෙහි තිබිණි.

සිය අනාගතය පිළිබඳව වඩාත් සැළකිල්ලෙන් සිතිය යුතු කාලය එළැඹ ඇති බවක් සුනන්දට දැනෙයි.

0000000

රාත්‍රියේ මධ්‍යම යාමයේ සුනන්ද පිබිදෙන්නේ පිපිරුම් හඬකින් ය. ඒ සමගින්ම වාගේ වෙඩි හඬ කීපයක් ද ඇසෙයි. වෙඩි හඬ දුරින් ඇසුණ ද පුරුද්දට වාගේ අත යන්නේ කොට්ටය යට ඇති පිස්තෝලයට ය.

"වෙඩි සද්දයක් නේද..?" පොඩි නෝනා කාමරයේ දොරෙන් මෙපිට සිට අසයි. සුනන්ද හා නිදි වරා පාඩම් කරමින් සිටින තිසල් සාලයට එන්නේ එක වරටම ය.

"බෝම්බ සද්දෙකුත් ආවා.." තිසල් බිය වී සිටින්නේ යයි සුනන්ද සිතෙයි. ඔහු ඉදිරි දොර වෙත යයි.

"යන්න එපා.. " අම්මා ඔහු වළක්වයි.

"බයවෙන්න එපා.. ළඟින් නෙවෙයි ඇහුණෙ.. " සුනන්ද ඉදිරි දොර අරියි. පාරේ මළානික විදුලි පහන් ආලෝකය යට සිටින විජිත සුනන්ද දකියි.

"පන්සල පැත්තෙන් ඇහුණෙ සුනයියා.." ඔහු සුනන්ද අසන්නට පෙරම කියයි. පන්සලේ ඝන්ඨා නාදය ඒ සමගම ඇසෙයි. "..මං කිව්වෙ.. පන්සලෙන්ම තමයි"

"වරෙන් මාත් එක්ක යන්න.." සුනන්ද මෝටර් සයිකලය පණ ගන්වයි. විජිත පසුබට වෙයි. "..ගෑනියෙක් වගේ ඇඹරෙන්නෙ නැතුව නැගපං යකෝ.."

0000000

වින්ධ්‍යා නැගිට ඇඳෙහි වාඩි වෙයි. පිපාසයක් දැනෙයි. ඕ ඇඳෙන් නැගිට සාලයට යන්නේ වතුර වීදුරුවක් බොන්නට ය. මේ මැදියම් රැයේ සාලයේ සැප පුටුවේ වාඩි වී සිටින රණසිංහ ඇගේ සිතේ ඇති කරන්නේ විමතියකි. බලාපොරොත්තු නොවූ මොහොතක වින්ධ්‍යා දැකීම ඔහු සිත අපහසුවට පත් කරයි.

"මහ රෑ නැගිටගෙන කොහෙ ඇවිදිනව ද..?" ඔහු ගේ කටහඬෙහි ඇති නුරුස්නා බව ඇගේ සිතේ ඇති කරන්නේ අප්‍රසාදයකි.

"මහ රෑ තිස්සෙ සාලෙ පුටුවක වාඩි වෙලා අහස පොළව ගැටලන්න කල්පනා කරන ගමන් ඔය ප්‍රශ්නෙ මගෙන් අහන්න ඔයා ගෙ මොළේ නරක් වෙලා ද..?" ඇගේ උපහාසාත්මක සිනාව ඔහු කෝප ගන්වයි. එහෙත් ඒ බව වසන් කරගන්නට ඔහුට හැකි ය.

"නින්ද ගියේ නැහැ.. ඒකයි වාඩි වෙලා හිටියෙ.."

"නිදාගන්න ආවෙම නැහැ නේද..?" වින්ධ්‍යා අසන්නේ වතුර වීදුරුවක් පුරවා ගන්නා අතර ය.

"නිදිමතක් ආවෙ නැහැ.. ඒකයි මං කියන්න ගියේ.." කී දේ වෙනස් කරන්නට ඔහු ගන්නා උත්සාහය වින්ධ්‍යා තේරුම් ගනියි. ඕ කිසිවක් නොකියා කාමරයට පිය මනියි.

"ඔයා ලොකු කරදරේක වැටෙනවා.. මං ඒක කල් ඇතිවම දන්නවා.. මේ පාර ඔය කරන සෙල්ලම කලින් කළ සෙල්ලම් වලට වඩා භයානකයි.." දොර අසළදී ආපසු හැරී බලන වින්ධ්‍යා කියයි.

"මොන සෙල්ලමක් ද..?" ඔහු ඈ දෙස නොබලාම අසයි.

"අකුරක් අකුරක් ගානෙ කියන්න ඕනෙ නැහැ.. මට නොකිව්වට මං හැම දේම හොඳට දකිනවා.. මං බෝඩිං කාරියක් ගානට දාලා සැළකුවට මං හැම දේම දන්නවා.." ඔහුට යමක් කියන්නට ඉඩ නොතබා ම ඇය කාමරය තුළට යයි.

ඔහුගේ ජංගම දුරකතනය නාද වනු ඇඳේ ඇළ වී සිටින වින්ධ්‍යාට ඇසෙයි. ඔහු පහත් හඬින් යම් කිසිවකු හා කතා කරයි. එයට ඇහුම් කන් දෙන්නට උනන්දුවක් ඇයට නැත. ඔහු අවදිව සිටියේ මේ දුරකතන ඇමතුම එන තෙක් ය යන්න ඇය දනියි.

වින්ධ්‍යා සුසුමක් හෙළයි. තමා ගේ ජීවිතය තුළ තව දුරටත් ජීවත් නොවන මිනිසකු පිළිබඳව වද වන්නට අවශ්‍ය නැත. ඕ නිදන්නට උත්සාහ කරයි. එහෙත් නින්ද ගව් ගාණක් ඈතින් ඇති සේ දැනෙයි.

000000000

පන්සලේ මහ ගේට්ටුවෙන් ඇතුල් වන සුනන්දගේ මෝටර් සයිකලය පොඩි හාමුදුරුවන්ගේ සිතේ ඇති කරන්නේ සහනයකි. සිත සන්සුන් කර ගෙන සිටින්නට මහත් වීර්යයක් ගනිමින් සිටිය ද තමා ගේ උත්සාහය වරින් වර අසාර්ථක වනු උන් වහන්සේට දැනෙයි. මේ සිදුවූයේ කිසි දිනෙක බලාපොරොත්තු වූ දෙයක් නෙවේ.

සුනන්ද දුටු සැණින් සෙදෝරිස් ඝන්ඨාවේ කඹය අතහැර දුව එයි. මහත් කම්පනයකට පත්ව සිටින සියදෝරිස් දකින සුනන්ද ගේ සිතේ ඇති වන්නේ කණගාටුවකි.

"ප... පන්සලට බෝම්ම ගැ.. ගැ.. ගැහුවා මහත්තයෝ.." ඔහු කෑ ගසයි. හතිය ඇවිස්සී ඇති නිසා නිසි ලෙස වචන පිට වන්නේ ද නැත.

සුනන්ද සයිකලයෙන් බසින්නේ පොඩි හාමුදුරුවන් අසලින්ම ය.

"කාටවත් තුවාල ද..?" ඔහු සයිකලයෙන් බසින අතර අසයි.

"කාටවත් අනතුරක් කරන අදහසින් කළ දෙයක් වෙන්න බෑ.." පොඩි හාමුදුරුවන් අත දික් කර පෙන්වන්නේ ආවාස ගෙයි දොර අසළ බෝම්බය පිපුරුණ තැන ය. බිඳී කුඩු වී ගිය මල් පෝච්චි කීපයත් බිත්තියේ ගැලවී ගිය බදාම පදාසයත් ඇරෙන්නට වෙනත් අලාභයක් සිදුවූ බවක් නොපෙනෙයි.

"වෙඩි සද්ද දෙකකුත් ඇහුණා.. කොහෙට වෙඩි තිබ්බද දන්නෑ.. අපි බය කරන්න තියන්න ඇති.."

සුනන්ද කැඩී බිඳී ගිය මල් පෝච්චි අතරින් ඇවිද ගොස් ආවාස ගෙට ඇතුල් වෙයි. සාලයේ හාන්සි පුටුවේ ලොකු හාමුදුරුවන් වාඩි වී සිටින්නේ හිසේ අත ගසා ගත් වනම ය.

"මේවා කවදා වෙච්ච දේවල් ද මහත්තයෝ..?" උන් වහන්සේ කියන්නේ සුනන්දගේ මුහුණ දෙසවත් නොබලා ය.

කියන්නට බොහෝ දේ සිතට ආව ද සුනන්ද කිසිවක් නොකියයි.

"මං හිත්තනෙ එක වාහනයයි ආවෙ.. මට එන සද්දෙ හොඳට ඇහුණා.. මං හිටියෙ බණ මඩුවෙ

14 වන පිටුවට